# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2005/17 – 2017 පෙබරවාරි 08 වැනි බදාදා – 2017.02.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 711, මල්ලවපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙලියගොන්න ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කේයු/එම්එල්එල්/2015/283 හා 2015.08.20 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0334 ක් පමණ වන කෝන්ගහමුලවත්ත නැමති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – කෝන්ගහමුලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0334 ක් පමණ

උතුරට: එන්. එච්. හලල්දීන් හිමිකම් කියන කෝන්ගහමුලවත්ත; නැගෙනහිරට: ඇළ; දකුණට: හිප්රා මාවත; බටහිරට: නූර් සදීකා හිමිකම් කියන කෝන්ගහමුලවත්ත සහ උම්මු සලීමා හිමිකම් කියන කෝන්ගහ - මුලවත්ත.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය : 4-3/9/2015/ඩබ්ලිව්එස්/30.
2016 ජූලි මස 13 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 - 856